# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


11/10/2013

## මාධ්‍ය නිවේදනයයි

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් යෝජනා කරන ලද පිටි කිරි වෙනුවට දියර කිරි ප්‍රවර්ධනය සඳහා වූ දස වැදෑරුම් ප්‍රතිපත්ති මාලාව සම්බන්ධ වූ තීරණාත්මක සාකච්ඡාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන්, නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් හා රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ සහභාගිත්වයෙන් අද උදෑසන පැවැත්විණි. එහිදී පහත තීරණ වලට එළඹුණි,

1. අනෙකුත් අමාත්‍යාංශයන්ට ආදර්ශයක් වන පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ සියලුම සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වල උත්සව වලදී පිටිකිරි වෙනුවට දියර කිරි පමණක් භාවිතා කිරීම.

2. පිටිකිරි වෙනුවට දියර කිරි යන සංකල්පය යටතේ ජනතාව දැනුවත් කිරීම සහ අත්‍යාවශ්‍ය ආහාර හා කිරිපිටි අතර ඇති සබඳතාවය සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම සෞඛ්‍ය අධ්‍යාපන කාර්‍යාංශයට පවරන ලදී.

3. රටපුරා තිබෙන සියලුම රෝහල්වල රෝගීන්ට දැනට ලබා දෙන පිටිකිරි වෙනුවට දියර කිරි ලබා දීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගත් අතර එහි මූලික පියවර ලෙස ඉදිරි සති දෙක තුලදී සෑම පලාතකම එක රෝහලක් බැගින් මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කර අදියරෙන් අදියර ව්‍යාප්ත කිරීම.

4. වෙළඳපොලේ ඇති පිටිකිරි වර්ග සඳහා රාජ්‍ය ලාංඡනය සහිත දැන්වීම් කිසිදු ආකාරයකින් නොයෙදීමටත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දැන්වීම් සෞඛ්‍ය ලේකම්තුමාගේ ඍජු අධීක්ෂණය යටතට පත් කිරීමටත් තීරණය වියග

5. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ යෝජනාවලිය ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය මෙහෙයුම් කමිටු දෙකක් මහජන සෞඛ්‍ය පිලිබඳ නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් දෙදෙනා යටතේ පිහිටුවීමටත් එයට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ නියෝජිතයින් පත් කිරීමත් සිදු විය.

6. ආර්ථික කටයුතු පිලිබඳ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය හා පශු සම්පත් අමාත්‍යාංශය යන අමාත්‍යාංශ අතර අන්තර් අමාත්‍යාංශ කමිටුවක් ඇති කර රටපුරා "පිටි කිරි වෙනුවට දියර කිරි" සංකල්පය යථාර්තයක් බවට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාකාරී දායකත්වය ලබා දීම.

මේ අනුව මෙම සාකච්ඡාවේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කරවීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ සක්‍රිය දායකත්වය ලබා දීමට බලා පොරොත්තුවන අතර ඒ තුලින් රට සංවර්ධනය කිරීමත් නිරෝගී අනාගත පරම්පරාවක් බිහි කිරීම සඳහා විද්‍යාත්මක අඩු මුදලකට සපයා ගත හැකි පෝෂ්‍යදායික ආහාර රටාවක් ශ්‍රී ලාංකික ජනතාවට ලබා දීම සඳහා නිරන්තරයෙන් පෙනී සිටිනු ඇත.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර -

වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516